# සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ**
**සැලසුම් ශිල්පී III ශ්‍රේණියට / සැලසුම් ශිල්පී පුහුණු ශ්‍රේණිය (එක් වසරක පුහුණු කාලය) සහ**
**සැලසුම් ශිල්පී පුහුණු ශ්‍රේණිය (දෙවසරක පුහුණු කාලය) බඳවා ගැනීමේ**
**විවෘත තරග විභාගය - 2026**

---

සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් සබරගමුව පළාතේ පදිංචි අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

I. සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ සැලසුම් ශිල්පී III ශ්‍රේණිය

II. සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ සැලසුම් ශිල්පී පුහුණු ශ්‍රේණිය (එක් වසරක පුහුණු කාලය)

III. සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ සැලසුම් ශිල්පී පුහුණු ශ්‍රේණිය (දෙවසරක පුහුණු කාලය)

02. **අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය :- 2026.03.13**

සේවයට බඳවා ගැනීම සඳහා වන තරඟ විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාළ සියළු සුදුසුකම් හා නියමිත වයස් සීමාව 2026.03.13 දිනට සෑම ආකාරයටම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි. 2026.03.13 දින වන විට අයදුම්කරනු ලබන ක්ෂේත්‍රයට අදාළව අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් ලබා තිබීම අනිවාර්ය වේ.

03.

3:1 පොදු සුදුසුකම් :-

(අ) අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

(ආ) විශිෂ්ට චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත විය යුතුය.

(ඇ) යම් ආගමික නිකායක පැවිදිවරයක් දරණ කිසිදු තැනැත්තෙකු මෙම තනතුරු සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් නොලබයි.

(ඈ) අයදුම්කරු 2026.03.13 දිනට සබරගමුව පළාත තුළ ස්ථිර පදිංචි අයෙකු විය යුතු අතර, එදිනට පූර්වාසන්න වසර 03 තුළ අයදුම්කරුට සබරගමුව පළාතේ වසර 03ක ස්ථිර පදිංචිය නොමැත්තේ නම්, අයදුම්කරුගේ කලත්‍රයා අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට (2026.03.13) පූර්වාසන්න වසර 03ක කාලය තුළ සබරගමුව පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

(ඉ) 2026.03.13 දිනට වයස අවු. 18 ට නොඅඩු සහ 30 ට නොවැඩි විය යුතුය.

3:2. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්

| තනතුර | අධ්‍යාපන සුදුසුකම් | | වෘත්තීය සුදුසුකම් |
|---|---|---|---|
| | **තනතුර සඳහා අ.පො.ස. (සා. පෙළ) සුදුසුකම** | **තනතුර සඳහා අ.පො.ස. (උ. පෙළ) සුදුසුකම** | |
| **සැලසුම් ශිල්පී**<br><br>**III ශ්‍රේණිය** | මව්බස (සිංහල /දෙමළ /ඉංග්‍රීසි භාෂාව) විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම | I. අ.පො.ස. (උ/පෙළ) විභාගයේ ගණිතය විෂය ධාරාව යටතේ සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, උසස් ගණිතය යන විෂයයන්ගෙන් 03 කින් එකවර සමත්වීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා ඉංග්‍රීසි හැර)<br><br>හෝ<br><br>II. අ.පො.ස. (උ/පෙළ) විභාගයේ ඉංජිනේරු තාක්ෂණවේදය විෂය ධාරාව යටතේ ඉංජිනේරු තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව යන විෂයයන් සහිතව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ගණිතය / චිත්‍රකලාව / කෘෂිවිද්‍යාව යන විෂයයන්ගෙන් 01 ක් සහිතව විෂයයන් 03 කින් එකවර සමත්වීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා ඉංග්‍රීසි හැර) | රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ 6) හයවන මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.<br><br>සටහන :- **ඉහත අයිතමය යටතේ සැලසුම් ශිල්පී ක්ෂේත්‍රයට අදාළව වෘත්තීය සුදුසුකම් ලබා තිබීම අනිවාර්ය වේ.** |

| **තනතුර** | **අධ්‍යාපන සුදුසුකම්** | | **වෘත්තීය සුදුසුකම්** |
|---|---|---|---|
| | **තනතුර සඳහා අ.පො.ස. (සා. පෙළ) සුදුසුකම** | **තනතුර සඳහා අ.පො.ස. (උ. පෙළ) සුදුසුකම** | |
| **සැලසුම් ශිල්පී පුහුණු කිරීමේ ශ්‍රේණිය**<br><br>**(එක් වසරක පුහුණු කාලය)** | මව්බස (සිංහල /දෙමළ /ඉංග්‍රීසි භාෂාව) විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම | I. අ.පො.ස. (උ/පෙළ) විභාගයේ ගණිතය විෂය ධාරාව යටතේ සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, උසස් ගණිතය යන විෂයයන්ගෙන් 03 කින් එකවර සමත්වීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා ඉංග්‍රීසි හැර)<br>හෝ<br>II. අ.පො.ස. (උ/පෙළ) විභාගයේ ඉංජිනේරු තාක්ෂණවේදය විෂය ධාරාව යටතේ ඉංජිනේරු තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව යන විෂයයන් සහිතව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ගණිතය / චිත්‍රකලාව / කෘෂිවිද්‍යාව යන විෂයයන්ගෙන් 01 ක් සහිතව විෂයයන් 03 කින් එකවර සමත්වීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා ඉංග්‍රීසි හැර) | I. තෘතීයික හා වෘත්තීය අධ්‍යයන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක සැලසුම් ශිල්පය පිළිබඳව එක් අවුරුදු පූර්ණ කාලීන පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතික පත්‍රය ලබා තිබීම<br>හෝ<br>II. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණික සහතික නිකුත් කරන ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියළු අතින්ම සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකමක් ලබා තිබීම |

| තනතුර | අධ්‍යාපන සුදුසුකම් | | වෘත්තීය සුදුසුකම් |
|---|---|---|---|
| | තනතුර සඳහා අ.පො.ස. (සා. පෙළ) සුදුසුකම | තනතුර සඳහා අ.පො.ස. (උ. පෙළ) සුදුසුකම | |
| **සැලසුම් ශිල්පී පුහුණු කිරීමේ ශ්‍රේණිය**<br><br>**(දෙවසරක පුහුණු කාලය)** | මව්බස (සිංහල /දෙමළ /ඉංග්‍රීසි භාෂාව) විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම | I.අ.පො.ස. (උ/පෙළ) විභාගයේ ගණිතය විෂය ධාරාව යටතේ සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, උසස් ගණිතය යන විෂයයන්ගෙන් 03 කින් එකවර සමත්වීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා ඉංග්‍රීසි හැර)<br>හෝ<br>II. අ.පො.ස. (උ/පෙළ) විභාගයේ ඉංජිනේරු තාක්ෂණවේදය විෂය ධාරාව යටතේ ඉංජිනේරු තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව යන විෂයයන් සහිතව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ගණිතය / චිත්‍රකලාව / කෘෂිවිද්‍යාව යන විෂයයන්ගෙන් 01 ක් සහිතව විෂයයන් 03 කින් එකවර සමත්වීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා ඉංග්‍රීසි හැර) | අදාළ නොවේ. |

සටහන :- I. අනුමත බඳවා ගැනීමේ පරිපාටියේ 7.1 හි විධිවිධාන හා සටහන අනුව පවතින සැලසුම් ශිල්පී පුරප්පාඩු සංඛ්‍යාවෙන් 70% ක් බාහිර අයදුම්කරුවන් සඳහා වන විවෘත තරඟ විභාගයකින් සම්පූර්ණ කෙරේ. 30% ක් සීමිත තරඟ විභාගය මගින් සම්පූර්ණ කෙරේ. ඒ අනුව විවෘත තරඟ විභාගය මගින් සම්පූර්ණ කරනු ලබන පුරප්පාඩු සංඛ්‍යාව 5 කි. සීමිත තරඟ විභාගය මගින් සම්පූර්ණ කරනු ලබන පුරප්පාඩු සංඛ්‍යාව 2 කි. සීමිත තරඟ විභාගයෙන් බඳවා ගැනීමට නියමිත ප්‍රතිශතය සඳහා ප්‍රමාණවත් මූලික සුදුසුකම් සහිත අභ්‍යන්තර අයදුම්කරුවන් සබරගමුව පළාත් සභාවේ දෙපාර්තමේන්තු /අමාත්‍යාංශ තුළ නොසිටී නම් පමණක් ඉතිරි ප්‍රමාණය විවෘත තරඟ විභාගය මඟින්ම තෝරා ගන්නා බාහිර අයදුම්කරුවන්ගෙන්ම සම්පූර්ණ කරනු ලැබේ.

II. සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ සැලසුම් ශිල්පී III ශ්‍රේණිය හා පුහුණු ශ්‍රේණි සඳහා බඳවා ගැනීමේදී පළමුව බඳවා ගනු ලබන්නේ III ශ්‍රේණියට වේ. III ශ්‍රේණියට සුදුසුකම් ලබන අයදුම්කරුවන් සංඛ්‍යාව පුරප්පාඩු සංඛ්‍යාවට ප්‍රමාණවත් නොවන විට, ඉතිරි පුරප්පාඩු සඳහා පුහුණු ශ්‍රේණියට අදාළ සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුළත් කර ගනු ලැබේ.

04. **වැටුප් පරිමාණය :-**

I. අංක 10/2025 හා 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව මෙම තනතුරේ III වැනි ශ්‍රේණියට අදාළ වැටුප් කාණ්ඩය MN 3 – 2025 වන අතර මාසික වැටුප් පරිමාණය රු. 52,250- 10×800- 11×1190- 10×1320- 10×1350 - රු. 100,040/- වේ.

II. සැලසුම් ශිල්පී පුහුණු ශ්‍රේණි සඳහා දීමනාව
රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි උපලේඛන VI අනුව හිමි මාසික දීමනාව -
තාක්ෂණ සේවයේ I වසර රු. 43,274 /-
තාක්ෂණ සේවයේ II වසර රු. 43,730 /-

05. III ශ්‍රේණියේ තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට අයදුම්කරු යටත් විය යුතුවේ.

06. බඳවා ගැනීමේ ක්‍රමය:-

i. III ශ්‍රේණියට බඳවා සෘජුව බඳවා ගනු ලබන අතර, පුහුණු ශ්‍රේණි වලට අදාළව ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත පරීක්ෂණයේ විෂයන් දෙකම සමත් විෂයන් දෙකම සමත් අයදුම්කරුවන් විසින් ලබා ගන්නා ලකුණු වල ප්‍රමුඛතාවය අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15 / 90හි සඳහන් අනෙකුත් විධිවිධාන අනුගමනය කරමින් දිස්ත්‍රික් ජනගහන අනුපාතය මත හා දිස්ත්‍රික් කුසලතා අනුපිළිවෙල පදනම් කර ගනිමින් පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමාන පිරිසක් බඳවා ගනු ලැබේ.

ii. සමත්වීම සඳහා එක් ප්‍රශ්න පත්‍රයකට ලබා ගත යුතු අවම ලකුණු ප්‍රමාණය 40 % කි.

iii. සැලසුම් ශිල්පී තනතුරු සඳහා වන බඳවා ගැනීමේ තරඟ විභාගයේ විෂය නිර්දේශය:

(අ) බුද්ධි පරීක්ෂණය - කාලය පැය 01යි. - ලකුණු 100 යි
අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලභාවයත්, සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත්, තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය.

(ආ) විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය - කාලය පැය 01 යි. - ලකුණු 100 යි
වීජ ගණිතය, ජ්‍යාමිතිය, ත්‍රිකෝණමිතිය ආදි විෂයයන් පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම, ගොඩනැගිලි ඉදි කිරීම් ද්‍රව්‍ය, ගොඩනැගිලි තාක්ෂණය, ගොඩනැගිලි සේවා, මැනීම හා මට්ටම් ගැනීම, මිනුම් ඒකක, පරිමාණ සිතියම් කියවීම, විද්‍යාත්මක ගණනය කිරීම ආදී විෂයයන් පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම සඳහා වූ ප්‍රශ්න පත්‍රයකි.

මෙම විභාගය, විභාග කොමසාරිස් ජනරාල් හෝ සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් සිංහල හා දෙමළ භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. ලැබෙන අයදුම්පත් සංඛ්‍යාව අනුව විභාගය පවත්වන නගරය තීරණය කරනු ලැබේ. විභාගයේදී අනන්‍යතාව තහවුරු කිරීම සඳහා වලංගු ජාතික හැඳුනුම්පත, වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය පමණක් පිළිගනු ලැබේ.

සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලැබේ. එහිදී ලකුණු ලබා නොදෙන අතර කායික යෝග්‍යතාවය හා සුදුසුකම්වලට අදාළ සහතික පරීක්ෂා කිරීම පමණක් සිදු කෙරේ.

**07 අයදුම් කිරීමේ ක්‍රමය**

7:1 මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය ප්‍රකාරව ඒ-4 ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්ත ප්‍රයෝජනයට ගනිමින් අනු අංක 01 සිට 03 තෙක් ඡේදයන් පළමුවන පිටුවටද අංක 04 සිට 06 තෙක් දෙවන පිටුවටද වශයෙන් ඇතුළත් වන සේ පිළියෙල කරගත් අයදුම්පත්‍රය තම අත්අකුරින්ම පිරවිය යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7.2 අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට අයදුම්කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන වෙනත් නිලධාරියකු ලවා ද එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු/ විශ්‍රාමික

නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන අයකු ලවා සහතික කරවාගෙන තිබිය යුතුය.

7.3 විභාග ගාස්තුව රු. 600/- කි. එම විභාග ගාස්තුව සබරගමුව පළාත් සභාවේ ඕනෑම අමාත්‍යාංශ කාර්යාලයකට / දෙපාර්තමේන්තුවකට (පළාත් පාලන ආයතන හැර) හෝ සබරගමුව පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය අයදුම් පත්‍රයේ අදාළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුය.**<u>එම විභාග ගාස්තුව ගෙවිය යුත්තේ සබරගමුව පළාත් සභා ආදායම් ශීර්ෂ 20.03.02.99 ට බැරවන ලෙසය</u>**. ගෙවනු ලබන විභාග ගාස්තුව කිසිදු හේතුවක් මත ආපසු ගෙවනු නොලබන ලබන අතර, මුදල් ඇණවුම්, මුද්දර භාරගනු නොලැබේ. මුදල් ගෙවා ලබා ගන්නා ලද කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගත යුතු වේ.

7:4 නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2026.03.13 දිනට පෙර ලියාපදිංචි තැපැලෙන්/ සීඝ්‍රගාමී තැපැලෙන් **ලේකම්, සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, නවනගරය, රත්නපුර** යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ සැලසුම් ශිල්පී III ශ්‍රේණියට/ පුහුණු ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2026"** යනුවෙන් සඳහන් කළයුතුය. නියමිත දිනට පසු ලැබෙන ඉල්ලුම්පත්, තනතුරට අදාළ සුදුසුකම් සපුරා නොමැති සහ අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7:5 අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා, නිවේදනයට අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව හෙළිවුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයෙන් ආවරණය නොවන වෙනත් කරුණක් වෙතොත් ඒ පිළිබඳව සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසන් තීරණය වන්නේය. එසේම මෙම බඳවා ගැනීමේ නිවේදනය අනුව මෙම පුරප්පාඩු පිරවීම හා ඉදිරියේදී ඇති වන පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීම සම්බන්ධයෙන් අවසන් තීරණය ගැනීම මෙම කොමිෂන් සභාව සතුවේ.

ඩබ්.ආර්. දිනීෂා එස්. රත්නායක
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත
2026

# ආදර්ශ අයදුම්පත්‍රය

සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ සැලසුම් ශිල්පී තනතුරුවල III ශ්‍රේණියට, සැලසුම් ශිල්පී ( පුහුණු ශ්‍රේණියට (එක් වසරක පුහුණු කාලය) සහ සැලසුම් පුහුණු ශ්‍රේණියට (දෙවසරක පුහුණු කාලය) බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2025

OPEN COMPITITIVE EXAMINATION FOR RECRUITMENT TO POSTDRAFTMEN GRS IN THE TECHNICAL SERVICE OF THE SABARAGAMUWA PROVINCIAL PUBLIC SERVICE DRAFTMEN GRADE III, TRAINEE (ONE YEAR TRAINING PERIOD) AND DRAFTMEN (TWO YEAR TRAINING PERIOD) – 2026

---

[ ]
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

නිවේදනයට අනුව ඉල්ලුම් කරන තනතුරු නාමය :- [ ]

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය [ ]
(**අදාළ අංකය** කොටුව තුළ ලියන්න )
සිංහල - 1
දෙමළ - 2

01. අ. මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම :-
( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් උදා : GUNAWARDHANA, M.G.B.S.K.)

ආ. සම්පූර්ණ නම:-
( සිංහලෙන් / දෙමළෙන්)

ඇ. සම්පූර්ණ නම :-
( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

ඈ. ජාතික හැඳුනුම්පත් අංකය:- [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

ඉ. දුරකථන අංකය:- [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

02. I. ස්ථිර ලිපිනය :-

II. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :- රත්නපුර [ ] කෑගල්ල [ ]

III. අයදුම්පත් භාර ගන්නා අවසන් දින වන 2026.03.13 දිනට සබරගමුව පළාතේ ස්ථිර පදිංචි කාලසීමාව
අවුරුදු :- [ ] මාස :- [ ] දින :- [ ]

03. I. ස්ත්‍රී/ පුරුෂ භාවය :- [ ]
ස්ත්‍රී-1, පුරුෂ-0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

II. උපන්දිනය :- වර්ෂය [ ] මාසය [ ] දිනය [ ]

III. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2026.03.13 දිනට වයස :-
අවුරුදු [ ] මාස [ ] දින [ ]

04. අධ්‍යාපන සුදුසුකම්

**4.1 අ.පො.ස (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර**

වර්ෂය : විභාග අංකය :

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

**(ප්‍රතිඵල සහතිකයේ ඡායා පිටපතක් අයදුම්පතට අමුණා එවිය යුතුය)**

**4.2 අ.පො.ස (උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර**

වර්ෂය : විභාග අංකය :

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |

**(ප්‍රතිඵල සහතිකයේ ඡායා පිටපතක් අයදුම්පතට අමුණා එවිය යුතුය)**

4 .3 තාක්ෂණ සුදුසුකම්:

| ආයතනය | හදාරා ඇති පාඨමාලාව | කාලසීමාව | සාමාර්ථය | සහතිකපත් අංකය හා වලංගු දිනය |
|---|---|---|---|---|
| | | | | |

**(වලංගු දිනය සඳහන් සහතිකයේ ඡායා පිටපතක් අයදුම්පතට අමුණා එවිය යුතුය)**

(මෙම තොරතුරු පැහැදිලිව හා නිවැරදිව සඳහන් කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ )

05. විභාග ගාස්තු ගෙවූ ලදුපත් අංකය:-

විභාග ගාස්තු ගෙවූ කාර්යාලය:-

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න
*( ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)*

06. අයදුම්කරුගේ සහතිකය

..............................................................වන මා විසින් මෙම අයදුම්පත්‍රයේ සපයා ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යයි සොයාගනු ලැබුවහොත් මා විසින් ඉල්ලුම් කර ඇති ඉහත තනතුරට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම නෙසලකා හරිනු ලැබීමටද මට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ලැබීමටද හැකි බව මම හොඳාකාරවම දනිමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීති රීති වලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

.......................................

දිනය:- අයදුම්කරුගේ අත්සන

**අයදුම්කරුගේ අත්සන සහතික කිරීම**
**( අනවශ්‍ය වචන කපා හරින්න )**

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන .......................................................... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය ................................... දින මා ඉදිරිපිටදී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම:-

අත්සන :-

තනතුර හා නිල මුද්‍රාව

(මෙම සහතිකය රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරිවරයෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු, රු.240360/- වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.)

**රජයේ හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා**
**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ( අනවශ්‍ය වචන කපා හරින්න )**

........................................................................................................ මයා/මිය/මෙනවිය දැනට ........................................................................... අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ / ආයතනයේ ................................................................. වශයෙන් ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක සේවයේ යෙදී සිටින බවත්, ඔහුට/ඇයට විරුද්ධව විනයානුකූලව කටයුතු කර නොමැති බවත්, විනයානුකූලව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත්, ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවත්, සහතික කරන අතර, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා ඔහු/ඇය තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරින් නිදහස් කළ හැකි බවත් නිර්දේශ කරමි.

දිනය :-

........................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
( නිල මුද්‍රාව තබන්න)